056105
ML|PR
2017|12|09
0049

# රටයකුම ශාන්තිකර්මයෙහි අන්තර්ගත

# නාට්‍යශාස්ත්‍ර මූලධර්ම

# පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්.

ගයානි උත්පලා සූරියආරච්චි
DD/MP/DA/08/007
පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය
2008/2009

UVPA - Lib. Main
056105
056105

# හැඳින්වීම

ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම පිළිබඳව විද්වත් පර්යේෂණ කිරීම ආරම්භ වූයේ මෙරට බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ සිට ය. ඒ අතර හියු නෙවිල් වැනි යටත්විජිත පාලකයන් විසින් දේශීය යාතුකර්ම හා අභිචාරවිධීන් පිළිබඳව සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදුකරන ලදී.[1] එදා මෙදා තුර විවිධ විද්වත්හු දේශීය ශාන්තිකර්ම පිළිබඳ ශාස්ත්‍රීය මංපෙත් ඔස්සේ පර්යේෂණ පැවැත්වීමට කටයුතු කළහ.

රටයකුම් ශාන්තිකර්මය නොහොත් රිද්දියාගය දාරකෝත්පත්තිය සම්බන්ධ මනෝචිකිත්සන ප්‍රතිකර්මයක් ලෙස ද ප්‍රබල නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත කලාංගයක් ලෙස ද සමාජ විද්‍යාත්මක පර්යේෂකවරුන්ගේ විමර්ශනයට ලක්ව ඇත. තත් ශාන්තිකර්මය හා එහි පවතින නාට්‍යමය ලක්ෂණ පිළිබඳ කරුණු නාට්‍ය ශාස්ත්‍රය ඔස්සේ ගවේශනය කිරීමට යොමු වූ විද්වතුන් ලෙස තිස්ස කාරියවසම්, ජයසේන කෝට්ටගොඩ, ලයනල් බෙන්තරගේ ආදීහු වෙසෙසින් සඳහන් කළ හැකි ය. ඔවුන් පහදා දුන් මග ඔස්සේ යාමේදී නාට්‍යශාස්ත්‍ර මූලධර්ම පදනම් කොටගත් දෘශ්‍ය කාව්‍යමය ලක්ෂණ වන අනුකරණය, රසභාව, සතර වෘත්තීන්, සතර අභිනය හා රංගභූමිය යන මාතෘකා ඔස්සේ ශාස්ත්‍රීය ගවේෂණයක් කිරීම කාලෝචිත බව පසක් කර ගැනීමෙන් ඊට අවකාශය යොදා ගැණුනි.

කිසියම් රටක ගැමි කලාවන් තම රටෙහි ස්වාධීන සම්ප්‍රදායන්ගේ අනන්‍යතාව පිළිබිඹු කරයි. එහෙත් කිසිදු කලාවකට ස්වාධීනව පෝෂණය විය නොහැකි ය. ඒ සඳහා විවිධ මූලාශ්‍රයන්ගෙන් පෝෂණය ලැබිය යුතු ය. රටයකුම නම් වූ ශාන්තිකර්මය කලාත්මක ලක්ෂණ සහිත නිර්මාණයක් වූයේ නම් එම කලාත්මක ලක්ෂණ නාට්‍ය ශාස්ත්‍රයෙන් පෝෂණය විය යුතු ය. එසේ නම් තත් යුගයේ නාට්‍යශාස්ත්‍රය කෘතිය මෙරට පරිශීලනය විය යුතු ය. ඒ පිළිබඳ කරුණු සෙවීම පළමු වන පරිච්ඡේදයේ අභිප්‍රාය යි.

මෙරට පැතිරගිය ශාන්තිකර්ම පද්ධතියෙහි විවිධ අරමුණු පවතී. නමුත් සියලු ශාන්තිකර්මයන්හි ආකෘතික ලක්ෂණ බොහෝ විට එක සමාන ස්වරූපයක් දරයි. පෙරයම, මධ්‍යම හා අලුයම යන කාල තුනක් හා එම කාලයන්හි ඉටු කරන ක්‍රියාවන් වන බුදුන්, දෙවියන් සිහිකර වින කළ යකුන්ට අඬ ගැසීම, පෙළපාලි දැක්වීම, පිදේනි ඔප්පු කිරීම, ආදී වශයෙන් දක්නට ලැබේ. මෙය බැලූ බැල්මට ඉතා සරල සංසිද්ධියක් වුව ද පුද්ගල යහපත සහ රස නිෂ්පත්තිය පිළිබඳ භරතමුනි ප්‍රකාශිත අදහස් හා භාව විශෝධනය පිළිබඳව ඇරිස්ටෝටල් ප්‍රකාශිත දර්ශණයට ද සමගාමී වන්නේ ය. ඒ අනුව පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා රටයකුම් ශාන්තිකර්මය පිළිබඳ මූලික හැඳින්වීමක් දෙ වන පරිච්ඡේදයෙහි සිදු කරනු ලබයි.

---

1 රත්නපාල, නන්දසේන ජනශ්‍රැති විද්‍යාව , ප්‍රථම මුද්‍රණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 9 පිටුව.

නාට්‍යශාස්ත්‍රය යනු ප්‍රාසංගික කලාව පිළිබඳව දැනුම කෝශ්ඨාගාරයකි. එහි අන්තර්ගත වන්නේ සංස්කෘත නාට්‍යය පිළිබඳව වුවද පෙරදිග ප්‍රාසංගික කලාවන්ට අවශ්‍ය මූලධර්ම මෙම පොතෙහි අන්තර්ගතව පවතී. මේ වන විට නාට්‍යශාස්ත්‍ර ග්‍රන්ථයෙහි සිංහල පරිවර්තන ද්විත්වයක් එළිදක්වා ඇත. එනම් වෝල්ටර් මාරසිංහයන් විසින් පරිවර්තනය කරන ලද භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර හා හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි විසින් පරිවර්තනය කරන ලද භරතමුණි විරචිත නාට්‍යශාස්ත්‍ර යන කෘතීන් ද්විත්වය යි. අප පර්යේෂණය සඳහා මෙම ග්‍රන්ථ ද්විත්වයම භාවිතයට ගැනුණි.

භරතමුනි විරචිත නාට්‍ය ශාස්ත්‍රයෙහි නාට්‍ය රචනය හා අනුකරණය පිළිබඳව මූලධර්ම ද්විත්වයක් ඇතුළත් වේ. මෙම ලක්ෂණ රටයකුම් ශාන්තිකර්මය පිළිබඳව කථා පුවත ගොඩනැගීමේදී මෙන්ම එහි අනුකරණ ක්‍රියාවලියෙහි ද අන්තර්ගත ය. මෙම සමගාමී ක්‍රියාවලිය කෙසේ සිදු වූයේ දැයි සිව් වන පරිච්ඡේදයෙන් විමසීමක් කිරීම අපේක්ෂිත ය.

පස් වන පරිච්ඡේදයෙන් නාට්‍යශාස්ත්‍රයේ අන්තර්ගත වෘත්තීන් සම්බන්ධව සාකච්ඡා කෙරේ. එහිදී නාට්‍ය වෘත්තීන් , නිර්මාණකරණයෙහි ලා එහි අවශ්‍යතාව හා නිර්මාණයක රිද්මය පවත්වා ගැනීමට නාට්‍ය වෘත්තීන් දායක වන ආකාරය පිළිබඳව විමසීමට ලක්කරනු ලබයි.

භරතමුනිගේ රස සූත්‍රය යනු ඉතා ගැඹුරු මනෝභාව විශ්ලේෂණයකි. මිනිස් හැසිරීම්, චර්යා රටාවන්, හා මනෝ රසායනික ක්‍රියාවලිය පිළිබඳව ගැඹුරු ගවේෂණාත්මක විග්‍රහයකි. රටයකුම් ශාන්තිකර්මයෙහි රස නිෂ්පත්තිය ද ප්‍රබල ගුණාත්මක ලක්ෂණවලින් යුක්තය. හය වන පරිච්ඡේදය වෙන් කෙරනුයේ රසභාව පිළිබඳව සංසන්දනාත්මක පැහැදිලි කිරීමට ය.

ආංගික, වාචික, හා සාත්වික අභිනයන් ද එම ත්‍රිත්වයේ සමවාය ද ඇතිව බිහිවන සාමාන්‍ය අභිනය පිළිබඳව භරතමුනි නාට්‍ය ශාස්ත්‍රයේ අභිනය ප්‍රභේද තුළින් පැහැදිලි කරයි. රටයකුමේ අන්තර්ගත මෙම සතර අභිනය ආශ්‍රිත සුවිශේෂතා හත් වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරයි.

එමෙන්ම මෙම පර්යේෂණය ඔස්සේ ශාන්තිකර්ම සම්බන්ධ සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයේ තවත් පැතිකඩ කිහිපයක් විවරණය කර ගැනීමට උත්සහ ගතිමි.

ශ්‍රී ලංකේය ශාන්තිකර්ම පද්ධතියෙහි අන්තර්ගතය සකස් කිරීමෙහිලා අනුගමනය කෙරෙන නිර්මාණාත්මක ක්‍රමෝපායයන් හි මූලයන් හඳුනා ගැනීමට උත්සහ දැරීම එක් පැතිකඩකි. එමගින් ජන විශ්වාසය මත ගොඩනැගුනු ශාන්තිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පුළුල් විචාරාත්මක පදනමක් ගොඩ නැංවිය හැකි ය. තව ද මෙරට සාම්ප්‍රදායික නර්තන ක්ෂේත්‍රයේ නිර්මාණාත්මක වටිනාකම අවබෝධ කොට ගැනීමට ද හැකි වනු ඇත. නාට්‍යශාස්ත්‍රය යනු පෙරදිග කලාපීය ප්‍රාසංගික විෂයයන් සඳහා ගුරු උපදේශ සපයන කෘතියකි. එමගින් දේශීය නිර්මාණකරණයෙහි දී ලබා ගත හැකි අභාසයේ පරිමාව හඳුනා ගැනීම අප පර්යේෂණයේ තවත් උත්සහයකි. එමගින් නූතන නිර්මාණකරණයෙහි ලා අනුගමනය කළ හැකි ක්‍රමවේද හඳුනා ගත හැකි වනු ඇත.